**1990 අංක 02 දරණ බස්නාහිර පළාතේ පළාත් සභා**

**වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධන) ප්‍රඥප්තිය**

# WESTERN PROVINCE PROVINCIAL COUNCIL PAYMENT OF SALARIOS AND ALLOWANCE (AMENDMENT) STATUTE NO; 02 OF 1990

1989 අංක 01 දරණ බස්නාහිර පළාතේ පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය සංශෝධනය කිරීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1990 අංක 02 දරණ බස්නාහිර පළාතේ පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, පළාතේ ආණ්ඩුකාරවරයාගේ එකඟත්වය ලැබුනු දිනයෙහි පටන් ක්‍රියාත්මක වනු ඇත. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

2. 1989 අංක 01 දරණ බස්නාහිර පළාතේ පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තියේ 02 වගන්තිය මෙයින් පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

(1) එම වගන්තියේ (ආ) උප වගන්තිය ඉවත් කිරීමෙන් ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීම.

,පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයාට ගෙවිය යුතු මාසික වැටුප රුපියල් අටදහස් පන්සීයක් (රු. 8500/=) විය යුතු අතර, මාසික සංග්‍රහ දීමනාව රුපියල් හත්සිය පනහක්ද (රු. 750/=) විය යුතුවේ.,

මෙම (සංශෝධන) ප්‍රඥප්තිය 1990.02.13 දින රැස්වූ බස්නාහිර පළාත් සභා

රැස්වීමේදී සභා සම්මත වූ බව සහතික කරමි.